රුහුණ විශ්වවිද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - 2016 / 2017

පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2017 සැප්තැම්බර්

**MAE 5101 - සාර්ව ආර්ථික න්‍යාය**

කාලය : පැය 03 යි.

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

<u>'අ' කොටස</u>

01.

(අ) "ආර්ථිකයක ආදායම සහ සේවා නියුක්තිය තීරණයවීම පිළිබඳව ඉදිරිපත් වී ඇති එක් න්‍යායයක් 'සැපයුම මගින් එයට හිමි ඉල්ලුම ජනිත කරයි' යන තර්කනය මත පදනම්ව ඇති අතර ඒ සම්බන්ධයෙන් වන තවත් න්‍යායයක් 'සඵල ඉල්ලුම' නැමැති සංකල්පය මත ඉදිරිපත් කරනු ලැබ ඇත." මෙම න්‍යායන් දෙකෙහි පැවතිය හැකි සමාන අසමාන කම් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ) සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී ඉහත පළමු න්‍යායට වඩා දෙවැන්න ඉදිරි පියවරක් සේ සැළකිය හැක්කේ කුමන අර්ථයෙන්ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05)

02.

(අ) ජාත්‍යන්තරව සිදුවන වෙළෙඳාමට හේතු විස්තර කිරීමෙහි ලා ඉදිරිපත් වී ඇති විකල්ප න්‍යායන් පිළිතුරු දීමට උත්සාහ ගන්නා මූලික ප්‍රශ්න ලේඛනගත කරන්න.

(ලකුණු 03)

(ආ) එය පදනම් වී ඇති තර්කයන් සහ උපකල්පන පැහැදිලිව දක්වමින් හෙක්ෂර්- ඕලින් (Heckscher – Ohlin) වෙළෙඳ න්‍යාය; ඉහත ඔබ ලේඛනගත කළ ප්‍රශ්නයන්ට පිළිතුරු සපයනු ලබන ආකාරය උචිත රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

## 'ආ' කොටස

03. පහත සඳහන් සමීකරණ වලින් දැක්වෙන ආදර්ශය ඔබ වෙත ලබාදී ඇත. (සියලු ස්වායත්ත විචල්‍ය අගයන් රුපියල් මිලියන වලිනි.)

$C = 200 + 0.25Y_d$

$I = 150 + 0.25\,Y - 1000\,r$

$G = 250$

$T = 200$

$(M/P)_d = 2Y - 8000\,r$

$M/P = 1600$

(අ) IS සහ LM වක්‍ර ව්‍යුත්පන්න කොට සමතුලිත පොළී අනුපාතිකය සහ මූර්ත නිමැවුම් මට්ටම ගණනය කරන්න.

(ලකුණු 05)

(ආ) මෙම ආර්ථිකයේ පරිභෝජන සහ ආයෝජන මට්ටම් ගණනය කරන්න.

(ලකුණු 02)

(ඇ) රාජ්‍ය වියදම 400 දක්වා වැඩි කිරීමේදී සමතුලිත පොළී අනුපාතිකය සහ මූර්ත නිමැවුම් මට්ටම කෙසේ වෙනස් වන්නේද? මෙහි ලා තෙරපුම් ප්‍රතිවිපාකයක් හට ගන්නේද? එසේ නම් එය කොපමණද?

(ලකුණු 03)

(ඈ) ආණ්ඩුවේ වියදම් පෙර පැවති මට්ටමට යළි හකුලුවා ගන්නේද ? විකල්ප වශයෙන් මූර්ත මුදල් සැපයුම 1600 සිට 1840 දක්වා ඉහළ නංවන්නේ යැයිද උපකල්පනය කරන්න. එමගින් නිමැවුම් මට්ටම, ආයෝජනය සහ පරිභෝජනය මත ඇති කරනු ලබන බලපෑම කුමක්ද?

(ලකුණු 03)

(ඉ) සුදුසු ප්‍රස්තාරික නිරූපනයන් යොදා ගනිමින් ඉහත 3 (අ) කොටසෙහි පොළී අනුපාතිකය ඉහළ යාමටත්, 3(ආ) කොටසෙහි පහළ යාමටත් හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 02)

04.

(අ) බබාලන්තය යනු බාහිර ප්‍රාග්ධන සංචලතාව කත්සේරු නො කළ බැවින් ඒ පිළිබඳ නො දන්නා රටකි. එම රට ක්‍රියාත්මක කරන්නේ පාවෙන විනිමය අනුපාත ක්‍රමයකි. මෙම ආර්ථිකයේ වෘද්ධි වේගය වැඩි කිරීම සඳහා වඩාත් යෝග්‍ය අය-වැය ප්‍රතිපත්තියද? නැතහොත් මූල්‍ය ප්‍රතිපත්තියද? යන්න තීරණය කිරීම සඳහා එරට මහ බැංකුවට ඔබගේ විශේෂඥ උපදෙස් අවශ්‍ය කර තිබේ. යෝග්‍ය උපදෙස් ලබා දෙන්න.
(IS-LM වක්‍ර සාමාන්‍ය අගයක් ගන්නා බව උපකල්පනය කරන්න.)

(ලකුණු 06)

(ආ) පහත දැක්වෙන අවස්ථාව ප්‍රස්ථාරයක නිරූපණය කරන්න.

i. ප්‍රාග්ධන සංචලතාව ශුන්‍ය නො වුනත් බොහෝ පහළයි.
ii. විනිමය අනුපාත ප්‍රතිපත්තිය නිෂ්ක්‍රීයකරණය සහිත ස්ථාවර ක්‍රමයකි.
iii. LM ඉහළට බෑවුම් වේ.
iv. IS පහළට බෑවුම් වේ.

ආරම්භක අවස්ථාවේ සමතුලිතව පැවති මෙම ආර්ථිකයේ ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව ගෙවුම්තුලන හිඟයක් හට ගන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඇ) "රටක බාහිර සමතුලිතතාව ස්ථාපිත කිරීම සඳහා විනිමය අනුපාත ප්‍රතිපත්තියත් අභ්‍යන්තර සමතුලිතය ස්ථාපිත කිරීම සඳහා අය-වැය ප්‍රතිපත්තියත් සාමාන්‍යයෙන් නිර්දේශ කෙරේ. එහෙත් ඇතැම් අවස්ථාවන්හිදී අපට මෙම ප්‍රතිපත්ති දෙක මීට ප්‍රතිවිරුද්ධ ආකාරයට යොදා ගැනීමට සිදුවේ." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 05)

## 'ඉ' කොටස

05.

(අ) ආර්ථිකයක උද්ධමනය හා සේවා නියුක්තිය අතර පවතින ගැටුම (Tradeoff) රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(ආ) මුදල් ඉල්ලුම සම්බන්ධ කේනීසියානු මතය කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 03)

(ඇ) කේනීසියානු මූර්ත මුදල් ශේෂ ඉල්ලුම (Demand for real Balances) ඇතුළත් සමීකරණය දක්වන්න.

(ලකුණු 01)

(ඈ) පහත සඳහන් එක් එක් සිද්ධීන් ආර්ථිකයක මුදල් ඉල්ලුම් වක්‍රය මත ඇතිකරන බලපෑම යෝග්‍ය රූප සටහන් ඇසුරින් පෙන්වා දෙන්න.

i. ආර්ථිකයේ ආදායම් මට්ටමේ ඉහළ යාමක්
ii. ආර්ථිකයේ උද්දමන අනුපාතිකය පහත වැටීමක්
iii. ආර්ථිකයේ ණය සුළභතාවයේ (Credit availability) ඉහළ යාමක්
iv. ප්‍රධාන බැංකු බිඳවැටීම පිළිබඳ ජනතාව අපේක්ෂා කිරීම.

(ලකුණු 08)

(06)

(අ) පහත සඳහන් න්‍යායාත්මක මහපෙන්වීම් භාවිත කරමින් 'මුදල් සැපයුම' අර්ථ දක්වන්න.

i. සම්ප්‍රදායික ප්‍රවේශය (The Traditional approach)

ii. චිකාගෝ ප්‍රවේශය (The Chicago approach)

iii. ගර්ලි සහ ෂෝ ප්‍රවේශය (Gurly and Shaw approach)

(ලකුණු 06)

(ආ) ශ්‍රී ලංකාවේ "ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට (M2b)" ඇතුළත් වන දෑ මොනවාද?

(ලකුණු 03)

(ඇ) කිසියම් කල්පිත ආර්ථිකයක 2016 වර්ෂයට අදාළ වන තෝරාගත් මූල්‍ය සංඛ්‍යා පහත ලේඛණය මගින් ඉදිරිපත් කෙරේ.

| අයිතමය | 2016 අවසානය (රුපියල් බිලියන) |
|---|---|
| i. ශුද්ධ විදේශීය වත්කම්<br>• මූල්‍ය අධිකාරීන්<br>• වාණිජ බැංකු | <br>560.0<br>-790.0 |
| ii. රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 1970.0 |
| iii. රාජ්‍ය සංස්ථාවලට දෙනලද ණය | 500.0 |
| iv. පෞද්ගලික අංශයට දෙනලද ණය | 4200.0 |
| v. සමස්ත ව්‍යවහාර මුදල් එකතුව | 550.0 |
| vi. අනෙකුත් අයිතම (ශුද්ධ) | -1030.0 |

ඉහත ලේඛනයේ අදාළ දත්ත භාවිතා කොට 2016 වර්ෂය සඳහා ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමේ (M2b) වටිනාකම ගණනය කරන්න.

(ලකුණු 03)

(ඈ) පහත සඳහන් උපකල්පිත දත්ත භාවිත කොට මුදල් ගුණකය (Money Multiplier) ගණනය කරන්න.

- සංසරණය වන ව්‍යවහාර මුදල් රුපියල් බිලියන 300
- මුළු තැන්පතු රුපියල් බිලියන 600
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%
- අතිරික්ත සංචිත අනුපාතය 2%
- පොදු මිල මට්ටම 10%

(ලකුණු 03)

-@@@@@@@